# ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ
# විදුලි කාර්මික තනතුර සඳහා වන
# බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටිය

01. **තනතුරු නාමය** : ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විදුලි කාර්මික

02. **තනතුර අයත්**

අමාත්‍යාංශය : ඌව පළාත් සභා සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශය

දෙපාර්තමේන්තුව : ඌව පළාත් සභා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

03. **පත්කිරීම් බලධරයා** : ඌව පළාත් සභා සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශ ලේකම්

04. **ක්‍රියාත්මක වන දිනය** : 2006-01-01

05. **අර්ථ නිරූපණ**

5.1 "බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය" යන පදයෙන් අදහස් වන්නේ ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විදුලි කාර්මික තනතුර සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය වේ.

5.2 **"ගරු ආණ්ඩුකාරතුමා"** යන පදයෙන් අදහස් කරන්නේ ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා වේ.

5.3 **"කොමිෂන් සභාව"** යනුවෙන් අදහස් කෙරෙන්නේ, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

5.4 **"ප්‍රධාන ලේකම්"** යන පදයෙන් අදහස් කෙරෙන්නේ ඌව පළාතේ ප්‍රධාන ලේකම්වරයා වේ.

5.5 **"පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්"** යන පදයෙන් අදහස් කෙරෙන්නේ, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වේ.

5.6 **"අමාත්‍යාංශ ලේකම්"** යන පදයෙන් අදහස් කෙරෙන්නේ, ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

5.7 **"දෙපාර්තමේන්තු ප්‍රධානියා"** යන පදයෙන් අදහස් කෙරෙන්නේ ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වේ.

5.8 **"සාමාන්‍ය කාර්ය සාධනය"** යනුවෙන් අදහස් කරනුයේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 08/98 අනුව කාර්ය සාධන ඇගයීම් වාර්තාවේ සතුටුදායක මට්ටමේ හෝ ඊට වඩා ඉහළ හොඳයි හෝ ඉතා හොඳයි යනුවෙන් වර්ගීකරණය කර තිබීම වේ.

5.9 **"සතුටුදායක සේවා කාලය"** යනු රජයේ සේවකයකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මඟින්ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්වීම මඟින්ද, පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මඟින් ද, එම කාලය තුලදී උපයා ගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු/ඇය අවවාද කිරීමක් හැර දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දාවූ කාල සීමාවක් වන්නේය.

5.10 **"සක්‍රිය සේවා කාලය"** යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියේ යෙදී සිටි සේවා කාලය වේ. රජයේ අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

2014/5/16

06. තනතුරේ සාරාංශය

ආයතනයේ සේවාවන් පවත්වාගෙන යෑමට ප්‍රශස්ථ විදුලි පරිභෝජනයක් සහතික කිරීම වස් සැලසුම් කිරීම. විදුලි උපකරණ සවි කිරීම, අලුත්වැඩියා කිරීම, විදුලි යන්ත්‍ර වල දෝෂ හඳුනාගෙන යථා තත්ත්වයට පත් කිරීම සහ ප්‍රබල දෝෂ කඩිනමින් ආයතන ප්‍රධානියා වෙත වාර්තා කිරීම.

6.1 රැකියා විස්තරය

උපලේඛණ අංක 01 හි දක්වා ඇත

07. සේවා කොන්දේසි

7.1. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

7.2. තෝරා ගනු ලබන්නන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයට ද, ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයටද, ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්ය සංග්‍රහයට ද, ඌව පළාතේ පළාත් සභා මුදල් රීති සංග්‍රහයටද, මුදල් රෙගුලාසි වලට ද, රජයේ සහ ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස් වලටද ඒවාට අදාළව වරින් වර නිකුත් කරනු ලබන සංශෝධන වලටද ඔබ යටත් වන්නේ ය.

7.3 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 ප්‍රකාරව පත්වීමේ දින සිට වසර පහක් (05)ක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

08. වැටුප් පරිමාණය හා සේවක ව්‍යුහය

8.1 රා.පරි.ච. 6/2006 අනුව ප්‍රාථමික මට්ටමට අයත් තනතුරක් වන අතර, වැටුප් කේත අංකය PL -3-2006 වේ.

වැටුප් පරිමාණය : රු. 12,360-10x110-10x120-10x130-12x140- 17,640/=

8.2 සේවක ව්‍යුහය හා එක් එක් ශ්‍රේණියට අදාල ආරම්භක මාසික වැටුප් පියවර :

| ශ්‍රේණිය | වැටුප් පියවර | ආරම්භක වැටුප |
|---|---|---|
| 111 | පියවර 01 | රු. 12,360 /= |
| 11 | පියවර 12 | රු. 13,580 /= |
| 1 | පියවර 22 | රු. 14,790 /= |
| විශේෂ | පියවර 32 | රු. 16,100 /= |

ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ විදුලි කාර්මික තනතුරට III,II,I හා විශේෂ ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ සේවක සංඛ්‍යාවට අයත් වේ. සේවක සංඛ්‍යාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන පරිදි තීරණය වේ.



මුද්‍රණපත හා ඇගයා බලා ... පිටපතක් බව සහතික කරමි.
2014/3/16
... / සහකාර ලේකම් / පරිපාලන නිලධාරි
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## 09. බඳවා ගැනිමේ සුදුසුකම්

### (අ) පොදු යෝග්‍යතා

I. පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුය.

II. අයදුම්කරුවන් විසින් අයදුම්පත් කැඳවන අවසාන දිනට ඌව පළාත තුළ අවම වශයෙන් පූර්වාසන්න අවුරුදු තුනක (03) ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන් විය යුතු අතර. ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන, ප්‍රාදේශිය ලේකම් විසින් අනුඅත්සන් කරන ලද නියමිත ආකෘතිය මගින් පදිංචිය සනාථ කළ යුතුය.

III. යහපත් චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

IV. ඉල්ලුම්පත් භාර ගැනිමේ අවසාන දිනට වයස අවුරුදු දහ අට (18)ට නොඅඩු සහ අවුරුදු හතලිස් පහ (45)ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ හා පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලනොපානු ඇත.

### (ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්

**I. අධ්‍යාපන සුදුසුකම්**

අ.පො.ස.(සා.පෙළ) විභාගයේදි දෙවරකට නොවැඩි වාර ගණනකදි යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හය (06)ක් සමත්වී තිබීම.

**II. වෘත්තිය සුදුසුකම්**

ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පිය නොවන හෝ අර්ධ ශිල්පිය තනතුරක සේවයේ ස්ථිර කර ඇති අවම වශයෙන් අවුරුදු 05කට නොඅඩු අඛණ්ඩ සතුටුදායක සක්‍රිය සේවා කාලයක් තිබීම.

විදුලි කාර්මික තනතුරට අදාළ තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව අනුමත කරනු ලබන කාර්මික හෝ වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තිය කුසලතාවයන්හි 4 වන මට්ටමට (NVQ 4) නොඅඩු මට්ටමේ ප්‍රවීනතා සහතිකයක් ලබා තිබිය යුතුය.

**සටහන : මෙම බඳවා ගැනිමේ පටිපාටිය ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරනු ලබන දිනට ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදි සිටින ප්‍රාථමික මට්ටමේ ශිල්පිය නොවන හා අර්ධ ශිල්පිය තනතුරක ස්ථිර කරන ලද සේවකයින් ඉහත I හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් වලින් නිදහස් කරනු ලැබේ.**

### (ඇ) බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්

**I. අධ්‍යාපන සුදුසුකම්**

අ.පො.ස.(සා.පෙළ) විභාගයේදි දෙවරකට නොවැඩි වාර ගණනකදි යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හය (06)ක් සමත්වී තිබීම.

II. වෘත්තිය සුදුසුකම්

විදුලි කාර්මික තනතුරට අදාළ තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව අනුමත කරනු ලබන කාර්මික හෝ වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තිය කුසලතාවයන්හි 4 වන මට්ටමට (NVQ 4) නොඅඩු මට්ටමේ ප්‍රවීනතා සහතිකයක් ලබා තිබිය යුතුය.

මුල්පිටපත හා [illegible] සත්‍ය පිටපතක් බව [illegible] කරමි.
2014/5/16
/ [illegible]

## 10. බඳවා ගැනීමේ ක්‍රමය

I. රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැනවීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවීමෙන් හෝ වෙනත් සුදුසු ක්‍රමයකින් අයදුම්පත් කැඳවා, අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කර වැඩි ලකුණු ලබා ගන්නා කුසලතා අංක අනුපිළිවෙල මත දෙපාර්තමේන්තුවේ පවත්නා පුරප්පාඩු ප්‍රමාණය ප්‍රතිශතය අනුව බඳවා ගනු ලැබේ.

II. බඳවා ගන්නා දිනට මුළු පුරප්පාඩු සංඛ්‍යාවෙන් 50%ක් අභ්‍යන්තර අයදුම්කරුවන් ගෙන් ද, 50%ක් බාහිර අයදුම්කරුවන්ගෙන් ද බඳවා ගනු ලැබේ.

III. සුදුසුකම්ලත් අභ්‍යන්තර අයදුම්කරුවන් නොමැති විට සියලු පුරප්පාඩු බාහිර අයදුම්කරුවන්ගෙන් පුරවනු ලැබේ.

IV. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 හා රාජ්‍ය ප්‍රතිපත්තින් යටතේ රජය වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ, නියෝග හා රෙගුලාසි අනුව බඳවා ගනු ලැබේ.

V. සේවක ගණය සඳහා බඳවා ගනු ලබන්නේ සේවක ගණයෙහි III වන ශ්‍රේණියට පමණි.

### 10.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ විෂය නිර්දේශය

I. විදුලි කාර්මික දැනුම පරීක්ෂා කිරීමේ, වාචික පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයකි. මෙහිදී අපේක්ෂකයාගෙන් පහත සඳහන් ක්ෂේත්‍රයන්ට අදාළ දැනුම පරීක්ෂා කෙරේ.

විදුලි කාර්මික ක්ෂේත්‍රයට අදාළ මූලික දැනුම, උපකරණ සවි කිරීම, අලුත්වැඩියා කිරීම පිළිබඳ දැනුම, අදාළ ක්ෂේත්‍රයේ උපකරණ වල දෝෂ හඳුනා ගැනීම, ක්ෂේත්‍රයට අදාළ උපකරණ භාවිතය පිළිබඳ දැනුම.

II. එක් එක් පරීක්ෂණය සමත්වීම සඳහා අවම වශයෙන් 40%ක් ලකුණු ලබා ගත යුතුය.

## 11. කාර්යක්ෂමතා කඩඉම් :-

පත්කිරීමේ බලධරයා විසින් කාර්යක්ෂමතා කඩඉම් විභාගය පවත්වනු ලැබේ. විභාගයේ විෂය නිර්දේශය ගැසට් නිවේදනයේ පළ කරනු ඇත. කාර්යක්ෂමතා කඩඉම් විභාගය වර්ෂයකට වරක් හෝ අවශ්‍යතාවය අනුව පවත්වනු ලැබේ. නියමිත කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නොවන තැනැත්තන් පිළිබඳව ආයතන සංග්‍රහයේ හා ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ විධිවිධාන අනුව ක්‍රියා කරනු ලැබේ.

කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම සඳහා එක් එක් විෂයට අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතුය. එක් එක් විෂයට වෙන වෙනම ද පෙනී සිටිය හැකිය.

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද |
|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට පත්වී වසර 03ක් ගත වීමට පෙර |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට උසස්වී වසර 03ක් ගත වීමට පෙර |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස්වී වසර 05ක් ගත වීමට පෙර |



මූල්‍යධනය හා ... බල
පිටපතක් ...
2014/5/16
ලේකම් / ...
ඌව පළාත් ...

11.1 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු |
|---|---|---|---|
| ආයතන හා මුදල් රීති | ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ - VII, VIII, X පරිච්ඡේද | පැය 02 | 100 |
| | ආයතන සංග්‍රහයේ - XII, XIII පරිච්ඡේද | | |
| | ඌව පළාතේ පළාත් සභා මුදල් රීති සංග්‍රහයේ - මු.රී. 101, 102, 103, සහ 104 | | |

11.2 II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු |
|---|---|---|---|
| ආයතන හා තනතුරට අදාළ විෂයය දැනුම | ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ - IX, X I පරිච්ඡේද | පැය 02 | 100 |
| | ආයතන සංග්‍රහයේ - XIV, XXV පරිච්ඡේද | | |
| | විදුලි කාර්මික විෂයය දැනුම | | |

11.3 **III** වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු |
|---|---|---|---|
| ආයතන හා මුදල් රීති | ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ - XIV , XV, XVI, XVIII පරිච්ඡේද | පැය 02 | 100 |
| | ආයතන සංග්‍රහයේ - VIII, XI, XXIII පරිච්ඡේද | | |
| | ඌව පළාතේ පළාත් සභා මුදල් රීති සංග්‍රහයේ - මු.රී. 101, 102, 103, 104, සහ 105 | | |

## 12. ශ්‍රේණිගත උසස් කිරීම්

කාර්ය සාධනය පදනම් කර ගත් පහත දැක්වෙන ආකාරයේ ශ්‍රේණිගත උසස්වීම් ක්‍රමයක් හිමි වේ.

### 12.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

(අ) පූර්ව අවශ්‍යතා

I. පත්වීම ස්ථිර කර තිබීම

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 8/98 හි දැක්වෙන පරිදි කාර්ය සාධන ඇගයීම් වාර්තාව අනුව පූර්වාසන්නතම වසර දහය (10) තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගෙන තිබීම.

VI. පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

(ආ) උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍රය උපලේඛන **II** සම්පූර්ණ කර දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

### 12.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

(අ) පූර්ව අවශ්‍යතා

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09) ක් උපයාගෙන තිබීම

II. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 8/98 හි දැක්වෙන පරිදි කාර්ය සාධන ඇගයීම් වාර්තාව අනුව පූර්වාසන්නතම වසර නවයක (09) තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

III. පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

(ආ) උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍රය උපලේඛන III සම්පූර්ණ කර දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව I ශ්‍රේණියට උසස් කිරීම සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

12.3 I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

(අ) පූර්ව අවශ්‍යතා

I. සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය(09)ක් උපයාගෙන තිබීම.

II. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 8/98 හි දැක්වෙන පරිදි කාර්ය සාධන ඇගයීම් වාර්තාව අනුව පූර්වාසන්නතම වසර නවයක (09) තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

III. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

(ආ) උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍රය උපලේඛන IV සම්පූර්ණ කර දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

මුල්පිටපත හා සසඳා බලා සත්‍ය පිටපතක් බව සහතික කරමි.
2014/5/16

13. **අන්තර්කාලීන විධිවිධාන :**

<u>සේවයේ යෙදී සිටින්නන් නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම</u>
<u>(දැනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ)</u>

නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 මගින් ලබා දී ඇති PL-03-2006 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන මෙහි සඳහන් සේවකයින් සියළු දෙනාම නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දින වන විට ලබා සිටි PL-03-2006 වැටුප් පරිමාණයේ අදාළ ශ්‍රේණිය/සේවා කාලය පදනම් කොට ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තියේ වැටුප පරිවර්තනය කිරීමේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන් ගත යුත්තේ ඒ ඒ ශ්‍රේණියට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වුවද අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේ දී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ඊළඟ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය.

**(I) III ශ්‍රේණිය**

(අ) PL- 3-2006 වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්.

(ආ) ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විදුලි කාර්මික III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ වුවද II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සම්පූර්ණ කර නොමැති සේවකයින්.

**III ශ්‍රේණියට 2006.01.01 දිනට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.**

**(II) II ශ්‍රේණිය**

(අ) PL-3-2006 වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) ක හෝ ඊට වැඩි එහෙත් අවුරුදු විස්ස (20)කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අවම වශයෙන් අවුරුදු දහයක (10)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ අවම වශයෙන් වැටුප් වර්ධක දහය (10)ක් උපයා ගෙන ඇති හා නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්.

(ආ) PL-3-2006 වැටුප් පරිමාණයෙහි II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 09ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්.

මුල්පිටපත හා සසඳා බලා සත්‍ය පිටපතක් බව සහතික කරමි.
2014/5/16
ලේකම් / සහකාර ලේකම් / පරිපාලන නිලධාරි
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

(ඇ) ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විදුලි කාර්මික II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර 09 සම්පූර්ණ වුවද නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව I ශ්‍රේණියට උසස්වීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්.

II ශ්‍රේණියට 2006.01.01 දිනට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(III) I ශ්‍රේණිය

(අ) ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විදුලි කාර්මික III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු විස්ස (20)ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 30කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, එමෙන්ම අවම වශයෙන් අවුරුදු විස්ස (20)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා අදාළ කාලය තුල අවම වශයෙන් වැටුප් වර්ධක විස්සක් (20)ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්.

(ආ) ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විදුලි කාර්මික II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවය (09)ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 19කට අඩු සේවා කාලයක් ඇති, එමෙන්ම අවම වශයෙන් අවුරුදු නවය (09)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ අදාළ කාලය තුල අවම වශයෙන් වැටුප් වර්ධක නවය (09)ක් උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්.

(ඇ) PL-3-2006 වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර 09ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්.

(ඈ) ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විදුලි කාර්මික I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය අවුරුදු නවය (09)ක් සම්පූර්ණ වුවද විශේෂ ශ්‍රේණියට උසස්වීමට අවශ්‍ය නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා නොමැති සේවකයින්.

I ශ්‍රේණියට 2006.01.01 දිනට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

මුල්පිටපත හා සසඳා බලා සත්‍ය පිටපතක් බව සහතික කරමි.
2014/5/16
ලේකම් / ... / පරිපාලන නිලධාරී
ඌව පළාත් ... සභාව.

(III) විශේෂ ශ්‍රේණිය

(අ) ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විදුලි කාර්මික III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 30ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, එමෙන්ම අවම වශයෙන් අවුරුදු තිහ (30)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ අදාළ කාලය තුල අවම වශයෙන් වැටුප් වර්ධක තිහ (30)ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්.

(ආ) ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විදුලි කාර්මික II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර දහ නවය (19) ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, එමෙන්ම අවම වශයෙන් අවුරුදු දහ නවය (19)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ අදාළ කාලය තුළ අවම වශයෙන් වැටුප් වර්ධක දහනවය (19)ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්.

(ඇ) ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විදුලි කාර්මික I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර නවය (09)ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, එමෙන්ම අවම වශයෙන් අවුරුදු නවය (09)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ අදාළ කාලය තුළ අවම වශයෙන් වැටුප් වර්ධක නවය (09)ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්.

(ඈ) PL- 3-2006 වැටුප් පරිමාණයෙහි විශේෂ ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක වැටුප් ලබන සේවකයින්.

**විශේෂ ශ්‍රේණියට 2006.01.01 දිනට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.**

සටහන :

මෙම එක් එක් ශ්‍රේණිය සඳහා අන්තර්ග්‍රහණය කරනු ලබන දින සිට ඔවුන්ට පෞද්ගලික වන සේ අදාළ කාර්යක්ෂමතා කඩඉමෙන් සමත්වීම සඳහා මෙම පරිපාටිය ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා අනුමත කරනු ලබන දින සිට වසර තුනක (03) සහන කාලයක් ලබා දෙනු ලැබේ.

14. පාලනය

14.1 ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විදුලි කාර්මික තනතුර මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියෙන් පාලනය වේ.

14.2 ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විදුලි කාර්මික තනතුරේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳව ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තිරණය කරනු ලැබේ.

මුල්පිටපත හා සසඳා බලා සත්‍ය පිටපතක් බව සහතික කරමි.
2014/5/16
ලේකම් / ... / පාලන නිලධාරී
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

## දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය සම්මත රීතීන්ට අනුකූලව මූලික පටිපාටි සමඟ පරීක්ෂා කර ඒ අනුසාරයෙන් අත්‍යවශ්‍ය සංශෝධන සහිතව සකස් කර ඇති බවත් ඌව පළාත් සහා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විදුලි කාර්මික තනතුරට බලපාන කොන්දේසි සියල්ල අවධානයට ලක් කර ඇති අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 ඇතුළු අදාළ චක්‍රලේඛ වල උපදෙස් පිළිපැද ඇති බවත් සහතික කරන අතර මෙම පටිපාටිය අනුමත කිරීම සුදුසු බව නිර්දේශ කරමි.

2014.....02.....28.

ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
බදුල්ල
(නිල මුද්‍රාව)

අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය :-

නිර්දේශ කරමි/ ~~නොකරමි~~

දිනය 2014 . 02 . 28

අත්සන

(නිල මුද්‍රාව)

ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය :-

නිර්දේශ කරමි/ ~~නොකරමි~~

අංකය 4/21/12/1/79

දිනය 18/03/14

අත්සන

පී.බී. අමරසේකර

(නිල මුද්‍රාව)

මුල්පිටපත හා සසඳා බලා සත්‍ය පිටපතක් බව සහතික කරමි.

2014/5/16

ලේකම් / ... / ... ඉංජිනේරු ... ඌව පළාත් ... කාර්යාලය.

ඌව පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :-

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව අනුමත කරමු.

01. සභාපති :-

02. සාමාජික :-

03. සාමාජික :-

04. සාමාජික :-

05. සාමාජික :-

දිනය :- 2014/04/03

**ආණ්ඩුකාරවර ලේකම්**

2014.04.03 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 10 යටතේ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඌව පළාත් සහා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විදුලි කාර්මික තනතුරේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

ලේකම්, 2014.04.17
ඌව පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
ඌව පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදිය.

**ආර්.එම්.ඒ.බී. හාකියල්දෙණිය**
**ලේකම්**
[illegible] කොමිෂන් සභාව

අනුමත කරමි/ ~~නොකරමි~~.

දිනය:- 2014/05/[illegible]

මුල්පිටපත හා සසඳා බලා සත්‍ය පිටපතක් බව සහතික කරමි.
2014/5/16
ලේකම් / [illegible] / පරිපාලන නිලධාරි
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

ගරු ඌව පළාත් ආණ්ඩුකාරවර
හි. නන්ද මැතිව්
ඌව පළාත් ආණ්ඩුකාරවර

ලේඛන I

<u>ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා</u>

<u>දෙපාර්තමේන්තුව - රැකියා විස්තරය</u>

නිලධාරියා / සේවකයාගේ නම :

01. තනතුර හැඳින්වීම :

| | | | |
|---|---|---|---|
| 1.1 | තනතුරු නාමය | : | විදුලි කාර්මික |
| 1.2 | ශ්‍රේණිය හා පන්තිය | : | I/II/III |
| 1.3 | දෙපාර්තමේන්තුව | : | ඌව පළාත් සභා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව |
| 1.4 | වැටුප් කේත අංකය | : | PL -3-2006 |
| 1.5 | වැටුප් පරිමාණය | : | 12,360-10x110-10x120-10x130-12x140- 17,640/= |
| 1.6 | අමාත්‍යාංශය | : | ඌව පළාත් සභා සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශය |
| 1.7 | තනතුරට අයත් සේවය | : | ප්‍රාථමික ශිල්පීය |

02. තනතුරේ සාරාංශය :

ආයතනයේ සේවාවන් පවත්වාගෙන යෑමට ප්‍රශස්ථ විදුලි පරිභෝජනයක් සහතික කිරීම වස් සැලසුම් කිරීම. විදුලි උපකරණ සවි කිරීම, අලුත්වැඩියා කිරීම, විදුලි යන්ත්‍ර වල දෝෂ හඳුනාගෙන යථා තත්ත්වයට පත් කිරීම සහ ප්‍රබල දෝෂ කඩිනමින් ආයතන ප්‍රධානියා වෙත වාර්තා කිරීම.

03. තනතුරේ සම්බන්ධතා පිළිබඳ තොරතුරු :

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ / ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ/වෛද්‍ය අධිකාරි / දෙපාර්තමේන්තුවට අදාළ නිලධාරීන් සමග මනා සම්බන්ධතාවයක් පවත්වා ගත යුතු වේ.

04. තනතුරට අයත් රාජකාරි කටයුතු :

ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල, මූලික රෝහල්, ප්‍රාදේශීය රෝහල්, ප්‍රාථමික රෝගී සත්කාර ඒකකය(මධ්‍යම බෙහෙත් ශාලා) හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල වල විදුලි උපකරණ සවි කිරීම, අලුත්වැඩියා කිරීම, විදුලි ඒකක වල/යන්ත්‍ර වල දෝෂ, විදුලි රැහැන් ඇදීම, ව්‍යාප්ත කිරීම හා ගොඩනැගිලි වල විදුලිය අලුත්වැඩියා කිරීම සහ ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරන වෙනත් රාජකාරි.

05. තනතුරේ වගකීම් :

ඔබට ඉහතින් පවරා ඇති රාජකාරීන් නිවැරැදිවත් කාර්යක්ෂම ලෙසත්, අනලස්වත් ඉටු කිරීම ඔබගේ වගකීම වේ. නියමිත වේලාවට ආයතනයට පැමිණීමට හා පිටවීමට වග බලා ගත යුතු අතර, එය නිසි පරිදි සනාථ කිරීම සඳහා ආයතනයේ ඇති විධිමත් පැමිණීමේ ලේඛනයක(පොදු 18 වැනි ආකෘතියේ) අත්සන් කළ යුතුය. ආයතනයට නොපැමිණෙන්නේ නම් විධිමත්ව නිවාඩු අනුමත කර ගත යුතුය.

06. කාර්ය සාධන ඇගයුම :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 8/98 විධිවිධාන පරිදි ඔබගේ කාර්ය සාධනය අගයනු ලැබේ. එහිදී රාජකාරි කටයුතු වල සමස්ත ගුණාත්මක භාවය, ආචාරශීලී භාවය, ආයතනයට කළට වේලාවට පැමිණීම, සේවය සඳහා ඇති කැපවීම සහ වැඩ පිළිබඳ ආකල්ප ද, සැලකිල්ලට භාජනය කරනු ලැබේ.

07. රාජකාරි ඉටුකරන වාතාවරණය :

ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව හා අනුබද්ධ සියලුම සෞඛ්‍ය ආයතන වල් කාර්ය මණ්ඩලය සමග අන්‍යෝන්‍ය සහයෝගයෙන් රාජකාරි ඉටු කළ යුතුය.

08. දැනුම කුසලතා :

චක්‍රලේඛ, ආයතන සංග්‍රහය, ඌව පළාත් සභා කාර්ය පටිපාටි රීති සංග්‍රහය, ඌව පළාත් සභා මුදල් රීති සංග්‍රහය සහ රෝගී සත්කාර සේවා සහ රෝග නිවාරණ සම්බන්ධව පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම තුලින් දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය කර ගත යුතුය. ඒ තුළින් ආයතනයේ ඵලදායිතාවය වර්ධනය කර ගැනීම සඳහා ද සහය ලබා දිය යුතුය.

මුල්පිටපත හා සසඳා බලා සත්‍ය පිටපතක් බව සහතික කරමි.
2014/5/16
ලේකම් / සහකාර ලේකම් / පරිපාලන නිලධාරි
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

## ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා
## දෙපාර්තමේන්තුවේ විදුලි කාර්මික තනතුරේ III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට
## උසස් කිරීමේ (සාමාන්‍ය කාර්ය සාධනය යටතේ) අයදුම්පත

(අදාළ නොමැති වචන කපා හරින්න. අංක 01 සිට 08 දක්වා ජේද අයදුම්කරු ද අංක 09-12 දක්වා ජේද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ද පිරවිය යුතුය.)

01. සම්පූර්ණ නම : ..............................................................

02. දැනට දරණ තනතුර/ශ්‍රේණිය : ..............................................................

03. සේවා ස්ථානය : ..............................................................

04. මුල් පත්වීමේ දිනය : ..............................................................

05. සේවයේ ස්ථිර කර තිබේද? : ..............................................................

ලිපියේ අංකය හා දිනය : ..............................................................

06. I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වූ

වර්ෂය හා දිනය : ..............................................................

ලිපියේ අංකය හා දිනය : ..............................................................

07. දෙවන භාෂා පරීක්ෂණය සමත් වූ

වර්ෂය හා දිනය : ..............................................................

ලිපියේ අංකය හා දිනය : ..............................................................

08. II වන ශ්‍රේණියට උසස් කිරීමේ

විභාගය සමත් වූ දිනය : ..............................................................

විදුලි කාර්මික තනතුරේ III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස්වීම් ලැබීමට සුදුසුකම් ලබා ඇති බව සහතික වෙමි.

....................................

(අයදුම්කරුගේ අත්සන)

..........................

(දිනය)

මුල්පිටපත හා සසඳා බලා සත්‍ය පිටපතක් බව සහතික කරමි.
2014/1/16
ලේකම් / සහකාර ලේකම් / පරිපාලන නිලධාරී
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

09. උසස්විමට පූර්ව වසර 05 තුළ වැටුප් වර්ධක උපයාගෙන තිබේද?

| වර්ෂය | ලබා ගත් වැටුප |
|---|---|
| ..................................... | ..................................... |
| ..................................... | ..................................... |
| ..................................... | ..................................... |
| ..................................... | ..................................... |
| ..................................... | ..................................... |

10. පූර්වාසන්න වසර 05 තුළ කාර්ය සාධන ඇගයිම් වාර්තාවේ සමස්ථ ඇගයිම් විස්තර

| | |
|---|---|
| ..................................... | ..................................... |
| ..................................... | ..................................... |
| ..................................... | ..................................... |
| ..................................... | ..................................... |
| ..................................... | ..................................... |

11. නිලධාරියාට එරෙහිව විනය පරික්ෂණ තිබේද? :........................................
එසේ නම් එම විස්තර :........................................
........................................

12. පෞද්ගලික ලිපිගොනුව අනුව ඉහත අංක I-II දක්වා කරුණු නිවැරදි බව සහතික කරමි.

II ශ්‍රේණියට උසස් කිරිමට විදුලි කාර්මික තනතුර සඳහා වන ........................................ ගේ අයදුම්පත නිර්දේශ කරමි.

........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන)

.........................
(දිනය)

අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

........................................
(අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන)

.........................
(දිනය)

මුල්පිටපත හා සසඳා බලා සත්‍ය පිටපතක් බව සහතික කරමි.
2014/5/16
ලේකම් / [illegible] / පරිපාලන නිලධාරි
[illegible] අමාත්‍යාංශය.

උපලේඛන III

**ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා**

**දෙපාර්තමේන්තුවේ විදුලි කාර්මික තනතුරේ II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට**

**උසස් කිරීමේ (සාමාන්‍ය කාර්ය සාධනය යටතේ) අයදුම්පත**

(අදාළ නොමැති වචන කපා හරින්න. අංක 01 සිට 08 දක්වා ජේද අයදුම්කරු ද අංක 09-12 දක්වා ජේද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ද පිරවිය යුතුය.)

01. සම්පූර්ණ නම : ..........................................................................

02. දැනට දරණ තනතුර/ශ්‍රේණිය : ..........................................................................

03. සේවා ස්ථානය : ..........................................................................

04. මුල් පත්වීමේ දිනය : ..........................................................................

05. I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වු

    වර්ෂය හා දිනය : ..........................................................................

    ලිපියේ අංකය හා දිනය : ..,.......................................................................

06. II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වු

    වර්ෂය හා දිනය : ..........................................................................

    ලිපියේ අංකය හා දිනය : ..........................................................................

07. දෙවන භාෂා පරීක්ෂණය සමත් වු
    වර්ෂය හා දිනය : ..........................................................................
    ලිපියේ අංකය හා දිනය : ..........................................................................

08. I වන ශ්‍රේණියට උසස් කිරීමේ

    විභාගය සමත් වු දිනය : ..........................................................................

විදුලි කාර්මික තනතුර සඳහා වන තනතුරේ II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස්වීම් ලැබීමට සුදුසුකම් ලබා ඇති බව සහතික වෙමි.

.........................................

(අයදුම්කරුගේ අත්සන)

............................

(දිනය)

මුල්පිටපත හා සසඳා බලා සත්‍ය පිටපතක් බව සහතික කරමි.
2014/8/16
... නිලධාරී ... සේවා.

09. උසස්වීමට පූර්ව වසර 05 තුළ වැටුප් වර්ධක උපයාගෙන තිබේද?

| වර්ෂය | ලබා ගත් වැටුප |
|---|---|
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |

10. පූර්වාසන්න වසර 05 තුළ කාර්ය සාධන ඇගයීම් වාර්තාවේ සමස්ථ ඇගයීම් විස්තර

| | |
|---|---|
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |

11. නිලධාරියාට එරෙහිව විනය පරීක්ෂණ තිබේද? :..........................................

එසේ නම් එම විස්තර :..........................................

..........................................

12. පෞද්ගලික ලිපිගොනුව අනුව ඉහත අංක I-II දක්වා කරුණු නිවැරදි බව සහතික කරමි.

I ශ්‍රේණියට උසස් කිරීමට විදුලි කාර්මික තනතුර සඳහා වන ..................................ගේ අයදුම්පත නිර්දේශ කරමි.

....................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන)

..........................

(දිනය)

**අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය**

....................................

(අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන)

..........................

(දිනය)

මුල් පිටපත හා සසඳා බලා සත්‍ය පිටපතක් බව සහතික කරමි.
2016/3/16
[illegible] පරිපාලන නිලධාරි
ලේකම් / [illegible] සභාව.

උපලේඛන IV

## ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විදුලි කාර්මික තනතුරේ I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ (සාමාන්‍ය කාර්ය සාධනය යටතේ) අයදුම්පත

(අදාළ නොමැති වචන කපා හරින්න. අංක 01 සිට 08 දක්වා ජේද අයදුම්කරු ද අංක 09-12 දක්වා ජේද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ද පිරවිය යුතුය.)

01. සම්පූර්ණ නම : ..........................................................................

02. දැනට දරණ තනතුර/ශ්‍රේණිය : ..........................................................................

03. සේවා ස්ථානය : ..........................................................................

04. මුල් පත්වීමේ දිනය : ..........................................................................

05. III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වූ

වර්ෂය හා දිනය : ..........................................................................

ලිපියේ අංකය හා දිනය : ..........................................................................

06. දෙවන භාෂා පරීක්ෂණය සමත් වූ

වර්ෂය හා දිනය : ..........................................................................

ලිපියේ අංකය හා දිනය : ..........................................................................

07. විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය සමත් වූ

වර්ෂය හා දිනය : ..........................................................................

ලිපියේ අංකය හා දිනය : ..........................................................................

08. විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය සමත් වූ දිනය : ..........................................................................

විදුලි කාර්මික තනතුර සඳහා වන තනතුරේ I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලැබීමට සුදුසුකම් ලබා ඇති බව සහතික වෙමි.

..........................................

(අයදුම්කරුගේ අත්සන)

..........................

(දිනය)

09. උසස්වීමට පූර්ව වසර 05 තුළ වැටුප් වර්ධක උපයාගෙන තිබේද?

| වර්ෂය | ලබා ගත් වැටුප |
| --- | --- |
| ........................................ | ............................................... |
| ........................................ | ............................................... |
| ........................................ | ............................................... |
| ........................................ | ............................................... |
| ........................................ | ............................................... |

10. පූර්වාසන්න වසර 06 තුළ කාර්ය සාධන ඇගයීම් වාර්තාවේ සමස්ථ ඇගයීම් විස්තර

| | |
| --- | --- |
| ........................................ | ............................................... |
| ........................................ | ............................................... |
| ........................................ | ............................................... |
| ........................................ | ............................................... |
| ........................................ | ............................................... |

11. නිලධාරියාට එරෙහිව විනය පරීක්ෂණ තිබේද? :............................................

එසේ නම් එම විස්තර :............................................

............................................

12. පෞද්ගලික ලිපිගොනුව අනුව ඉහත අංක I-II දක්වා කරුණු නිවැරදි බව සහතික කරමි. විශේෂ සාමාන්‍ය ක්‍රමය යටතේ උසස් කිරීමට විදුලි කාර්මික තනතුර සඳහා වන ................... ...................ගේ අයදුම්පත නිර්දේශ කරමි.

......................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන)

...........................

(දිනය)

අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

......................................

(අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන)

...........................

(දිනය)

මුල්පිටපත හා සසඳා බලා සත්‍ය පිටපතක් බව සහතික කරමි.

2014/5/16

ලේකම් / සහකාර ලේකම් / පරිපාලන නිලධාරී

ඌව පළාත් [illegible] සේවා කොමිෂන් සභාව.